සවියෙන් පෙරට අපි එකට

e- ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 8 | ඉතිහාසය | 3 | 04. දේශ ගවේශණ හා යුරෝපා ජාතීන් පෙරදිගට පැමිණීම |

සැකසුම: ඩී. එල්. පී. ශ්‍යාමලී

බප/හො/දීයකඩුව ක.වි

# විෂයය අන්තර්ගතය

4.1 හැඳින්වීම

4.2 දේශ ගවේෂණ කටයුතුවල පසුබිම

4.3 දේශ ගවේෂණවලට බලපෑ හේතු

4.4 දේශ ගවේෂණයට සම්බන්ධ වූ පුද්ගලයින් හා ප්‍රධාන රටවල්

4.5 යුරෝපා ජාතීන් පෙරදිගට පැමිණීම

# 4.1 හැදින්වීම

* යුරෝපා ජාතීන් නව මුහුදු මාර්ග සොයා ගනිමින් එතෙක් හඳුනා නොගත් රටවල් සොයා ගැනීම දේශ ගවේශණය නම් වේ.
* 15 වන ශත වර්ෂය අග භාගයේ දී යුරෝපා මහද්වීපයට බැහැරින් පිහිටි රටවල් සොයා යාමට යුරෝපීයයන්ට බලවත් උනන්දුවක් ඇති විය.



* එහි ප්‍රතිඵලයක් ලෙස ආසියාව, ඇමරිකාව හා අප්‍රිකාව යන මහද්විපවල තිබු රටවල් සොයා ගෙන ඒවායේ ජනතාව හා සම්පත් පිළිබඳ තොරතුරු රැසක් අනාවරණය කර ගැනීමට යුරෝපීයයන්ට හැකි විය.



# අතීතයේ රුවල් නැව් යොදා ගනිමින් දේශ ගවේෂණ කටයුතුවල යෙදුණු ආකාරය



# 4.2 දේශ ගවේෂණ කටයුතුවල පසුබිම




* දේශ ගවේෂණ ආරම්භ වීමට පෙර යුරෝපා ජාතීන්ට යුරෝපය, උතුරු අප්‍රිකාව, ආසියානු මහද්වීපවල සුළු ප්‍රදේශයක් හැර ලෝකයේ බොහෝ ප්‍රදේශ පිළිබඳ නිසි අවබෝධයක් නොතිබුණි.
* චීනය, ඉන්දියාව වැනි රටවල් පිළිබඳව ඒ වනවිට වෙළෙන්දන් අසා තිබුණේ මාර්කෝ පෝලෝ වැනි නිර්භීත ගත් කතුවරුන්ගේ කතාවලින් පමණි.

* මෙම දේශ ගවේෂණ ආරම්භ වීමට පෙර ලෝක වෙළඳාමෙන් වැඩි කොටස මධ්‍යධරණී මුහුද හා ඒ අවට ප්‍රදේශයට සීමා වී තිබීම.
* මධ්‍යධරණී මුහුද අවට පැවති වෙළඳ නගර නම්,
    - ජිනෝවා
    - වැනීසිය
    - ඇලෙක්සැන්ඩ්‍රියා
    - කොන්ස්තන්තිනෝපලය

# 4.3 දේශ ගවේෂණයට බලපෑ හේතු

1. කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කිවරුන්ට යටත් වීම හා සාම්ප්‍රදායික වෙළඳ මාර්ග අවහිර වීම

* කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කිවරුන්ට යටත් වීම දේශ ගවේෂණයට බලපෑ ආසන්නතම හේතුව විය.
* ඉහත සඳහන් මාර්ග ඔස්සේ යුරෝපයට ගෙන ගිය වෙළඳ ද්‍රව්‍ය කොන්ස්තන්තිනෝපල් නගරයේදී යුරෝපීය වෙළඳුන් මිළදී ගන්නා ලදී.
* 1453 වර්ෂයේදී මෙම නගරය තුර්කිවරුන් යුද්ධ මාලාවකින් පසු අල්ලා ගත් අතර යුරෝපීය ජාතිකයින්ගේ වෙළඳාමට ඉන්පසු බාධා පමුණුවන්නට විය.
* තුර්කි ජාතිකයින් මෙතෙක් තිබූ සාම්ප්‍රදායික වෙළඳ මාර්ග අවහිර කිරීම නිසා යුරෝපා ජාතීන් ආසියාවට පැමිණීමට නව මාර්ග සොයා යන්නට විය.

## 2. දේශ ගවේෂණවලට සුදුසු පසුබිමක් යුරෝපය තුළ ගොඩනැගී තිබීම.

* පුනරුද සමයේ සිදු වූ නව විද්‍යාත්මක සොයා ගැනීම් දේශ ගවේෂණයට බලපෑවේය.

# ආසියාව හා යුරෝපය අතර වෙළඳ සබඳතා පැවැත් වූ ප්‍රධාන මාර්ග තුනකි

1. කොන්ස්තන්තිනෝපලය → පර්සියාව → මධ්‍යම ආසියාව
   චීනය (සේද මාවත) ←

2. කොන්ස්තන්තිනෝපලය → මධ්‍යධරණී මුහුද ඔස්සේ
   රතුමුහුද හරහා ඉන්දියානු සාගරයට ← මිසරය
   (ගොඩබිම් මාර්ග/ කුළුබඩු මාර්ග)

3. කොන්ස්තන්තිනෝපලය → පර්සියන් බොක්ක
   ඉන්දියාවේ බටහිර වෙරළ

* මෙම මාර්ග ඔස්සේ ගෙන යනු ලබන භාණ්ඩ ඇලෙක්සැන්ඩ්‍රියාවේදී වැනීසියේ හා ජිනෝවාහි වෙළඳුන් මිලදී ගන්නා ලදී.


# අතීත වෙළඳාම් කටයුතුවල යෙදුණු මාර්ග

* සේද මාවත - ගොඩබිම් මාර්ගය



# අතීත වෙළදාම් කටයුතුවල යෙදුණු මාර්ග

* සේද මාවත - මුහුදු මාර්ගය



# 4.4 දේශ ගවේෂණයට සම්බන්ධ වූ පුද්ගලයන් හා ප්‍රධාන රටවල්

* දේශ ගවේෂණයට සම්බන්ධ වූ පුද්ගලයන්

- **නාවික හෙන්රි**

පෘතුගාලයේ නාවික අභ්‍යාස විද්‍යාලයක් ආරම්භ කිරීම

එහි සිසුන්ට නාවික ශිල්පය, නැව් තැනවීම, සිතියම් හැදෑරීම,

තාරකා ශාස්ත්‍රය ඉගැන්වීම.

- **බර්තොලමියුඩයස්**

අප්‍රිකාවේ දකුණු කෙළවර පිහිටි කුණාටු තුඩුව දක්වා පැමිණීම.



* දේශ ගවේෂණයට සම්බන්ධ වූ පුද්ගලයන්

- වස්කෝ ද ගාමා - ඉන්දියාවට පැමිණීම.
- ක්‍රිස්ටෝපර් කොළොම්බස් - ඉස්පැනියෝලාව සොයා ගැනීම.
- ඇමරිගෝ වෙස්පුචි - ඇමරිකාව
- ෆර්ඩිනන්ඩ් මැගලන් - ලෝකය ගෝලාකාර බව.

# දේශ ගවේෂණයට සම්බන්ධ වූ පුද්ගලයන් හඳුනා ගනිමු

ක්‍රිස්ටෝපර් කොළොම්බස්



වස්කෝද ගාමා



## නාවික හෙන්රි



## ෆර්ඩිනන්ඩ් මැගලන්



# දේශ ගවේෂණයට සම්බන්ධ වූ රටවල්

* පෘතුගාලය
* ස්පාඤ්ඤය
* එංගලන්තය
* ප්‍රංශය
* ඕලන්දය



# යුරෝපා ජාතීන් ආසියාවට පැමිණීම

* යුරෝපා ජාතීන් ආසියාවට පැමිණීමට පෙර ආසියානු ප්‍රදේශවල වෙළඳ කටයුතුවල යෙදුනේ මුස්ලිම් වෙළඳුන්ය.
* කොන්ස්තන්තිනෝපල් නගරය මුස්ලිම් වෙළඳුන් යටත් කර ගැනීමෙන් පසු යුරෝපීන්ගේ වෙළඳාමට බලපෑම් එල්ල විය.
* එහි ප්‍රතිඵලයක් ලෙස යුරෝපීන්ට ආසියාවට පැමිණීමට මුහුදු මාර්ග සොයන ලදී.

# යුරෝපීයන් ආසියාවට පැමිණීමේ අරමුණු

1. ආසියානු ප්‍රදේශවල වැවෙන කුළුබඩු ඇතුළු වෙළඳ ද්‍රව්‍ය ලබා ගෙන යුරෝපයට ගෙන ගොස් විකුණා ආර්ථික වශයෙන් ලාභ ලැබීම.
2. මුස්ලිම් ජාතිකයන් සතු ආසියාවේ වෙළඳ ඒකාධිකාරය යුරෝපීයන් අතට ලබා ගැනීම.



# යුරෝපීයන් ආසියාවට පැමිණීමේ අරමුණු

## 3. ආසියාතික රටවල තම ආගම පැතිර වීම

* යුරෝපීයන් අතුරින් ප්‍රථමයෙන් ම ආසියාවට පැමිණියේ පෘතුගීසීන්ය.

* 1498 වර්ෂයේ දී වස්කෝ ද ගාමා ඉන්දියාවේ කැලිකට් වරායට පැමිණ ඇත.

* පෘතුගීසීන්ගේ පෙරදිග වෙළඳ මධ්‍යස්ථානය බවට ගෝව තෝරා ගන්නා ලදී

* ඉන් ශතවර්ෂයකට ආසන්න කාලයක් ගිය පසු ලන්දේසීන්ද ආසියාවට පැමිණි අතර ඔවුන් පෙරදිග ඕලන්ද වෙළඳ සමාගම පිහිටුවමින් වෙළඳ කටයුතුවල යෙදුණි.

* පෘතුගීසි හා ලන්දේසීන් පසුව බ්‍රිතාන්‍ය හා ප්‍රංශ ජාතිකයන් ආසියාවට පැමිණ යටත් විජිත පිහිටුවමින් වෙළඳ කටයුතුවල යෙදී ඇත.

සවියෙන් පෙරට අපි එකට

*e*- ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 8 | ඉතිහාසය | 3 | **04. දේශ ගවේශණ හා යුරෝපා ජාතීන් පෙරදිගට පැමිණීම -ඇගයීම-** |

**සැකසුම: ඩී. එල්. පී. ශ්‍යාමලී**
**බප/හො/දීයකඩුව ක.වි**

**1. <u>දේශ ගවේෂණ කටයුතුවල පසුබිම.</u>**

1.1. දේශ ගවේෂණ කටයුතුවල යෙදීමට මුල් වූ මහද්වීපය නම් කරන්න.

1.2. දේශ ගවේෂණය ආරම්භ වීමට පෙර මධ්‍යධරණී මුහුද ආශ්‍රිත පැවති වෙළඳ නගර මොනවාද?

1.3. ආසියාව හා යුරෝපය අතර වෙළඳ සබඳතා පැවැත්වූ ප්‍රධාන මාර්ග තුන නම් කරන්න.

**2. <u>දේශ ගවේෂණවලට බලපෑ හේතු.</u>**

2.1. දේශ ගවේෂණවලට බලපෑ ආසන්නතම හේතුව කුමක්ද?

2.2. යුරෝපා වෙළඳුන්ගේ ප්‍රධාන වෙළඳ මධ්‍යස්ථානය කුමක්ද?

2.3. එම නගරය අල්ලාගත් තුර්කිවරු යුරෝපීයන්ගේ වෙළඳාමට බාධා කලේ කෙසේද?

**3. <u>දේශ ගවේෂණවලට රාජ්‍ය අනුග්‍රහය ලැබීම.</u>**

3.1. දේශ ගවේෂණවලට අනුග්‍රහය දැක්වූ රටවල් නම් කරන්න.

3.2. ආසියාවට මුල්වරට පැමිණි පෘතුගීසි ජාතිකයා නම් කර ඔහු ගොඩ බැස්ස රට නම් කරන්න.

3.3. ඔහු එහිදී කළ ප්‍රකාශය කුමක්ද?

3.4. පෘතුග්‍රීසි ජාතික නාවික හෙන්රි ගෙන් දේශ ගවේෂණයට සිදු වූ සේවය කුමක්ද?

3.5. පහත සඳහන් දේශ ගවේශකයන් සොයා ගත් රටවල් හා ප්‍රදේශ නම් කරන්න.

a) බර්තොලමියු ඩයස් -

b) වස්කෝ ද ගාමා -

c) ක්‍රිස්ටෝපර් කොලොම්බස් -

d) ඇමරිගෝ වෙස්පුචි -

e) ෆර්ඩිනන්ඩ් මැගලන් -

## 4. යුරෝපා ජාතීන් ආසියාවට පැමිණීම.

4.1. පහත සඳහන් රටවලින් යුරෝපයට ගෙන ගිය භාණ්ඩ මොනවාද?

a) චීනය -

b) ජපානය -

c) ශ්‍රී ලංකාව -

d) ඉන්දියාව -

e) නැගෙනහිර ඉන්දීය දූපත් -

4.2. යුරෝපීයන් ආසියාවට පැමිණීමේ අරමුණු තුනක් ලියන්න.

## 5. පෘතුගීසීන් ආසියාවට පැමිණීම.

5.1. යුරෝපීයන් අතුරින් ප්‍රථමයෙන් ආසියාවට පැමිණියේ කවුද?

5.2. ආසියාවට පැමිණි ප්‍රථම පෘතුගීසි ජාතිකයා, ඔහු පැමිණි වර්ෂය, පැමිණි රට හා වරාය පිළිවෙලින් නම් කරන්න.

5.3. පෘතුගීසීන්ගේ පෙරදිග වෙළඳ මධ්‍යස්ථානය නම් කරන්න.

## 6. ලන්දේසීන් පැමිණීම.

6.1. ආසියාවට පැමිණි මුල් කාලයේ ලන්දේසීන්ගේ අවධානය යොමු වූයේ කවර ප්‍රදේශය කෙරෙහිද?

6.2. ලන්දේසීන්ගේ වෙළඳ සමාගම නම් කරන්න.

## 7. <u>බ්‍රිතාන්‍ය හා ප්‍රංශ ජාතිකයන්ගේ පැමිණීම.</u>

7.1. බ්‍රිතාන්‍ය පෙරදිග වෙළඳ මධ්‍යස්ථානය නම් කරන්න.

7.2. බ්‍රිතාන්‍යයන් යටත් කරගත් රටවල් නම් කරන්න.

7.3. ඉන්දියාවට පැමිණි ප්‍රංශ ජාතිකයින් ඉන්දියාවේ පිහිටුවා ගනු ලැබූ වෙළඳ බලකොටු මොනවාද?

සවියෙන් පෙරට අපි එකට

*e*- ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 8 | ඉතිහාසය | 3 | 04. දේශ ගවේශණ හා යුරෝපා ජාතීන් පෙරදිගට පැමිණීම පිළිතුරු |

සැකසුම: ඩී. එල්. පී. ශ්‍යාමලී
බප/හො/දීයකඩුව ක.වි

**1. <u>දේශගවේෂණ කටයුතුවල පසුබිම.</u>**

1.1. යුරෝපය

1.2. ජිනෝවා

ඇලෙක්සැන්ඩ්‍රියා

වැනීසිය

කොන්ස්තන්තිනෝපලය

1.3. i කොන්ස්තන්තිනෝපල් නගරයේ සිට පර්සියාව, මධ්‍යම ආසියාව හරහා චීනය

ii කොන්ස්තන්තිනෝපල් නගරයේ සිට මධ්‍යධරණී මුහුද ඔස්සේ මිසරයට පැමිණ රතු මුහුද හරහා ඉන්දියානු සාගරය ආශ්‍රිත ප්‍රදේශයට.

iii කොන්ස්තන්තිනෝපල් නගරයේ සිට පර්සියන් බොක්ක හරහා ඉන්දියාවේ බටහිර වෙරළ දක්වා.

**2. <u>දේශ ගවේෂණවලට බලපෑ හේතු.</u>**

2.1. කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කිවරුන්ට යටත් වීම.

2.2. කොන්ස්තන්තිනෝපලය

2.3. වෙළඳ භාණ්ඩවල මිල වැඩි කිරිම.

තීරු ගාස්තු වැඩි කිරීම.

අත්‍යවශ්‍ය වෙළඳ ද්‍රව්‍ය කලට වේලාවට නොසැපයීම.

**3. <u>දේශ ගවේෂණවලට රාජ්‍ය අනුග්‍රහය ලැබීම.</u>**

3.1. පෘතුගාලය ප්‍රංශය

ස්පාඤ්ඤය ඕලන්දය

එංගලන්තය

3.2. වස්කෝ ද ගාමා

ඉන්දියාවට

3.3. "ක්‍රිස්තියානි හා කුළුබඩු සොයා අපි මෙහි පැමිණියෙමු."

3.4. පෘතුගාලයේ නාවික අභ්‍යාස විද්‍යාලයක් ආරම්භ කර නාවික ශිල්පය, ඉගැන්වීමට කටයුතු කිරීම, එමෙන්ම නැව් තැනවීම, සිතියම් හැදෑරීම, තාරකා ශාස්ත්‍රය වැනි විෂයයන් ඉගැන්වීම.

3.5.

a) බර්තොලමියු ඩයස් - අප්‍රිකාවේ දකුණු කෙළවර පිහිටි කුණාටු තුඩුව

b) වස්කෝ ද ගාමා - ඉන්දියාව

c) ක්‍රිස්ටෝපර් කොලොම්බස් - ඉස්පැනියෝලාව

d) ඇමරිගෝ වෙස්පුචි - ඇමරිකාව

e) ෆර්ඩිනන්ඩ් මැගලන් - පිලිපීනය

**4. <u>යුරෝපා ජාතීන් ආසියාවට පැමිණීම.</u>**

4.1.

a) චීනය - සේද රෙදි, සුවඳ විලවුන්, පිඟන් භාණ්ඩ, සතුන්

b) ජපානය - රිදී

c) ශ්‍රී ලංකාව - මුතු මැණික්, කුළුබඩු, ඇතුන්,ඇත්දත්

d) ඉන්දියාව - ගම්මිරිස්, අබිං, කුරුඳු, කපු රෙදි

e) නැගෙනහිර ඉන්දීය දූපත් - කරාබු නැටි, කරඳමුංගු, සාදික්කා

4.2.

- ආසියාවේ ඇති වටිනා කුළුබඩු ඇතුළු වෙළඳ ද්‍රව්‍ය යුරෝපයට ගෙන ගොස් අලෙවි කර ආර්ථික ලාභ ලබා ගැනීම.
- මුස්ලිම් ජාතිකයන් සතු වෙළඳ ඒකාධිකාරය යුරෝපීන් අතට ලබා ගැනීම.
- ආසියාතික රටවල තම ආගම පැතිර වීම.

**5. <u>පෘතුගීසීන් ආසියාවට පැමිණීම.</u>**

5.1. පෘතුගීසීන්

5.2. වස්කෝ ද ගාමා

1498

ඉන්දියාව

කැලිකට්

5.3. ගෝව

**6. <u>ලන්දේසි පැමිණීම.</u>**

6.1. අග්නිදිග ආසියානු දූපත්.

6.2. පෙරදිග ඕලන්ද වෙළඳ සමාගම.

**7. <u>බ්‍රිතාන්‍ය හා ප්‍රංශ ජාතිකයන්ගේ පැමිණීම.</u>**

7.1. පෙරදිග ඉන්දියානු වෙළඳ සමාගම

7.2.

- ඉන්දියාව
- බුරුමය
- ශ්‍රී ලංකාව

7.3.

- පොන්ඩිචෙරි
- කරිකාල්
- චන්ද්‍ර නගර්